සම්මාන

# නොබෙල් ත්‍යාග ලද්දෝ

## වෛද්‍ය විද්‍යාව

### සෛලයේ චක්‍රීයකරණය ගැන කළ පර්යේෂණ

මෙවර වෛද්‍ය විද්‍යාව සඳහා පිරිනැමෙන නොබෙල් ත්‍යාගය සඳහා හිමිකම් ලැබුවේ ඇමරිකානු ජාතික ලේලන්ඩ් හාර්ට්වෙල් සහ බ්‍රිතාන්‍ය ජාතිකයන් වන පෝල් නර්ස් හා තිමොති හන්ට් යන තිදෙනා ය.

ඔවුන් නොබෙල් ත්‍යාගය සඳහා නම් කරනු ලැබුවේ සෛලයේ චක්‍රීකරණ ක්‍රියාව පිළිබඳ ඔවුන් විසින් (වෙන වෙනම) කරන ලද පර්යේෂණ වෙනුවෙනි.

හැට එක් හැවිරිදි ලේලන්ඩ් හාර්ට්වෙල් සිට්ල්හි ෆ්‍රෙඩ් හචින්සන් පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ය. ඔහුට නොබෙල් ත්‍යාගය හිමි වූයේ සෛල චක්‍රයේ ක්‍රියා පාලනය කරන ජාන වර්ගයක් සොයා ගැනීම වෙනුවෙනි. ඔහු විසින් සොයා ගනු ලැබ ඇත්තේ සෛල චක්‍රය ඇරඹීම පාලනය කරන ආරම්භක ජානය යි (Start gene). සෛල චක්‍රයේ අධ්‍යයනයන් සඳහා ජාන විද්‍යාත්මක ක්‍රමෝපායන් භාවිතා කළ යුතු බව හාර්ට්වෙල් පැවසුවේ 60 දශකය තරම් ඈතක සිට ය.

1961 දී කැලිෆෝනියා තාක්ෂණික ආයතනයෙන් විද්‍යාවේදී උපාධිය හිමි කර ගත් ඔහු 1965 දී කැලිෆෝනියා සරසවියේ සහකාර මහාචාර්ය තනතුරකට පත් විය. 1968 දී ඔහු වොෂින්ටන් සරසවියේ මහාචාර්ය ධුරයකට පත් විය. 1998 දී ඔහුට ඇල්බට් ලාස්කර් වෛද්‍ය පර්යේෂණ සම්මානය හිමි විය.

පනස් දෙහැවිදිරි පෝල් නර්ස් 70 දශකයේ සිට සෛල චක්‍රය පිළිබඳ පර්යේෂණවල යෙදෙන්නෙකි. 1996 සිට ඔහු ලන්ඩනයේ ඉම්පීරියල් පිළිකා පර්යේෂණ අරමුදලේ



ජෝශප් ස්ටිග්ලිට්ස්

අධ්‍යක්ෂ ජනරාල්වරයා ය. එමෙන්ම එහි සෛල චක්‍ර පර්යේෂණාගාරයේ ප්‍රධානියා ද ඔහුම ය. 1970 දී විද්‍යාවේදී උපාධිය (බ්‍රිමින්හැම් සරසවියෙන්) ලබාගත් ඔහු 1973 දී නැගෙනහිර ඇන්ග්ලියා සරසවියෙන් ආචාර්ය උපාධිය හිමි කර ගත්තේ ය. 1998 දී ඔහුට ද ඇල්බට් ලාස්කාර් සම්මානය හිමි විය.

8 හැවිරිදි තිමොති හන්ට් නොබෙල් සම්මානය හිමි කර ගත්තේ සෛල චක්‍රයේ දී සයික්ලින් නම් ප්‍රෝටීනයේ ක්‍රියාව ගැන කළ අධ්‍යයනයන් වෙනුවෙනි.

1980 දශකයේ දී මුහුදු ඉකිරි ආදර්ශක පද්ධති ලෙස ගෙන සයික්ලින් ගොඩනැගීම හා බිඳවැටීම පෙන්වා දීමට ඔහු සමත් විය. වෙනත් සත්ත්ව විශේෂ තුළ ද සයික්ලින් ක්‍රියාව සිදුවන බව හන්ට් පසුව සොයා ගත්තේ ය. මිනිසා තුළ එකිනෙකට වෙනස් සයික්ලින වර්ග දහයක් පවතින බව අද සොයා ගෙන ඇත. ලන්ඩනයේ ඉම්පීරියල් පිළිකා පර්යේෂණ අරමුදලේ ප්‍රධාන විද්‍යාඥයකු ලෙස කටයුතු කරන ඔහු තමාගේ ප්‍රථම උපාධිය ලබා ගත්තේ 1964 දී ය. විශේෂත්වය නම් එය ශාස්ත්‍රවේදී(BA)උපාධියක් වීමයි. මීට වසර හතරකට පසු ඔහු ආචාර්ය උපාධිය ද හිමිකර ගත්තේ ය. 1993 දී ඔහු ඒබ්‍රහම් වයිට් විද්‍යා සම්මානය (ජෝර්ජ් වොෂින්ටන් සරසවියෙන් පිරිනමන) හිමිකර ගත්තේ ය.

## භෞතික විද්‍යාව

### පරමාණුව ගැන කළ නව සොයා ගැනීම්

මෙවර භෞතික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමිව ඇත්තේ එරික් කෝර්නල් හා කාර්ල් වෙයිමන් නැමැති ඇමරිකානු ජාතිකයන් දෙදෙනාට හා පරමාණු ජාතික වුල්ෆ් නැන්ග් කෙට්ලර්ට ය. ඔවුන් නොබෙල් ත්‍යාගය හිමිකර ගත්තේ පරමාණුව පිළිබඳව කළ හැදෑරීම් වෙනුවෙනි. වායුමය මූලද්‍රව්‍යයන්ගේ



ජෝජ් අකෙර්ලොෆ්

පරමාණු අධික ශීත (හිමායන) තත්ත්වය යටතේ වෙනස් ස්වරූපවලට හැරෙන බව පෙන්වා දීමට මේ විද්‍යාඥයෝ සමත් ව සිටිති. සාමාන්‍යයෙන් වායුමය මූලද්‍රව්‍යවල පරමාණු හැසිරෙන්නේ එහා මෙහා විසිවෙන බිලියඩ් බෝල පරිද්දෙනි. එහෙත් අධික ලෙස සිසිල් කළ විට, වඩාත් නිවැරදිව කිවහොත් නිරපේක්ෂ ශූන්‍යයට පත් කළ විට, පරමාණු පෙළපාලියක යන සොල්දාදුවන් පිරිසක් සේ එක පෙළකට සැකසෙන බව මොවුනගේ හමැදෑරීම්වලින් හෙළිවී තිබේ. මෙහිදී ඇතිවන අවස්ථාව පදර්ථයේ අවස්ථා තුන වන ඝන, ද්‍රව, වායු යන එක් කොටසකටත් අයත් නොවේ. මෙය ඒ අවස්ථා තුනටම ඇතුළත් නොවන තත්ත්වයකි. මේ තත්ත්වයේදී මූලද්‍රව්‍ය පරමාණු පාලනය කරන්නට පහසු ය. මේ නිසාම එම තත්ත්වයේ පරමාණු භාවිතය නිසා ක්ෂුද්‍ර පරිගණක උපාංග නිපදවීම් වැනිදේට අදාළ කර්මාන්තවලත් ගුවන්යානා මෙහෙයුම්වලත් විශාල විප්ලවයක් ඇතිවනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය.

තවත් විදිහකට කිවහොත් මේ විද්‍යාඥයන් තිදෙනා අනාවරණය කොට ඇත්තේ පරමාණු ලේසර් ක්‍රමයකි. මේ පරමාණු ලේසර් භාවිත කොට දැනට වඩා ඉතා කුඩා ක්ෂුද්‍ර පරිගණක පරිපථ බිහිකිරීමට අනාගතයේ දී හැකිවනු ඇත.

## ආර්ථික විද්‍යාව

### වෙළෙඳපොළ ආර්ථිකයේ නව විප්ලවයකට මඟ

ආර්ථික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමි වී ඇත්තේ ඇමරිකානුවන් තිදෙනෙකුට ය. ඔවුන් නම් ජෝශප් ස්ටිග්ලිට්ස්, ජෝර්ජ් අකෙර්ලොප් හා මයිකල් ස්පෙන්ස් ය. නිව්යෝක්හි කොලොම්බියා සරසවියේ ව්‍යාපාර හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ මහාචාර්යවරයකු වන 58 හැවිරිදි ස්ටිග්ලිට්ස් ක්ලින්ටන් ජනාධිපතිවරයාගේ සමයේ දී ධවල මන්දිරයේ ආර්ථික උපදේශකයකු ලෙස කටයුතු කර ඇත.

61 හැවිරිදි ජෝර්ජ් අකෙර්ලොප් ආර්ථික විද්‍යා මහාචාර්යවරයෙක් ලෙස කැලිෆෝනියා සරසවියේ සේවය කරයි.

58 හැවිරිදි මයිකල් ස්පෙන්ස් ද ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි.

ඔවුන් තිදෙනාට නොබෙල් ත්‍යාගය හිමිවූවේ ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයට අසමමිතික තොරතුරු නම් සංකල්පය හඳුන්වාදීම හේතුකොටගෙන ය.

තොරතුරුවල අසම්පූර්ණතාව හා අසමමිතිකතාව වෙළෙඳපොළ ආර්ථිකයට බලපාන අන්දම ඔවුන් විසින් පැහැදිලි කර දී ඇති අතර එය

වෙළෙඳපොළ ආර්ථිකයේ නව විප්ලවයකට මං පාදන්නක් වනු ඇත.

ඔවුන්ගේ මේ නව සංකල්පය මගින් සම්ප්‍රදායික ආර්ථික සිද්ධාන්ත අභියෝගයට ලක් වේ. රක්ෂණ ආයතන තොරතුරු හිඟ අවස්ථාවන්හිදී ගැටලුවලට මුහුණ දිය යුත්තේ කෙසේද යන්න ගැන ස්ටිග්ලිට්ස්ගේ ඇතැම් ක්ෂේත්‍ර පර්යේෂණවලින් පෙන්වා දී තිබේ.

ස්ටිග්ලිට්ස් කලක් ලෝක බැංකුවේද සේවය කළ අතර ඒ කාලසීමාව තුළ ඔහු ඉතා නිර්දය ලෙස ලෝක බැංකු ප්‍රතිපත්ති විවේචනය කළේ ය.

අසමමිතික තොරතුරු සංකල්පය සරලව විස්තර කිරීමට පහත දැක්වෙන අවස්ථා ඉදිරිපත් කළ හැකි ය. සමාගමක කළමනාකරුවන් හා අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ලාභ ගැන කොටස්කරුවන්ට වඩා දැන සිටීම, භාණ්ඩයක් ගැන පාරිභෝගිකයාට වඩා වෙළෙන්ද දැනසිටීම වැනි දේ අසමමිතික තොරතුරු සැපයීමට නිදසුන් සේ දිය හැකි ය.

## රසායන විද්‍යාව

### ඔසු නිපදවිය හැකි නව මං

මෙවර රසායන විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමි වූයේ විලියම් ක්නොලස්, බැරි සාර්ප්ලස් යන ඇමරිකානු විද්‍යාඥයන් දෙදෙනාට හා ජපාන ජාතික රියෝජි නොයොරිට ය.

පුළුල් පරාසයක පැතිරී ගිය රෝග ගණනාවකට ආරක්ෂක හා ලාභදායී ඖෂධ නිපදවිය හැකි නව ක්‍රම සොයා ගැනීම වෙනුවෙනි, ඔවුනට මේ ත්‍යාගය හිමි වූයේ. අසමමිතික සංශ්ලේෂණය යනුවෙන් හැඳින්වෙන ක්‍රියාදමය ගැන කළ අධ්‍යයනයන් හරහා මේ ඖෂධ නිපදවීමේ නව ක්‍රමෝපායන් අනාවරණය කර ගත හැකිව තිබේ. මේ ක්‍රම තුළින් ප්‍රතිදේහ ඖෂධ මෙන් ම හෘදරෝග සඳහා ඖෂධත් ඉන්ෆ්ලුවෙන්සාව, පාකින්සන් වැනි රෝග සඳහා ඖෂධත් නිපදවිය හැකිවෙතැයි අපේක්ෂිත ය.

84 හැවිරිදි ක්නොලස් ඇමරිකානු කෘෂි රසායන සමාගමක් වන මොන්සැන්ටෝ හි රසායන විද්‍යාඥයකු ලෙස සේවය කොට දැන් විශ්‍රාම ගෙන සිටින්නෙකි. සාප්ලස් කැලිෆෝනියාවේ ස්ක්‍රිප්ස් අධ්‍යාපන ආයතනයේ රසායන විද්‍යා මහාචාර්යවරයෙකි.

නොයොරි ජපානයේ නගෝයා සරසවියේ කථිකාචාර්යවරයකු සේ සේවය කරයි. ක්නොලස් සිය පර්යේෂණවල දී සොයා ගත් L-DOPA(එල්ඩෝපා) නම් ඖෂධය පාකින්සන් රෝගය සඳහා භාවිත කළ හැකි අගනා ඔසුවකි. මේ ඖෂධයේ තත්ත්වය දියුණු කරලීමට උදව් වූයේ සාර්ප්ලස් හා නොයොරි ය.

නොයොරි රසායන විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගයක් දිනා ගත් තුන්වන ජපන් ජාතිකයා ය.

## සාමය

මෙවර සාමය පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමිව ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංවිධානයටත් එහි මහ ලේකම් කොෆි අන්නන් මහතාටත් ය.

පොදුවේ ලෝක සාමය වෙනුවෙන් කටයුතු කිරීම හා විශේෂයෙන් ඒඩ්ස් මර්දන ව්‍යාපාරය සාර්ථකව සිදුකිරීම මේ ත්‍යාගය එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා අන්නන්ට හිමිවීමට හේතු ලෙස ප්‍රකාශ වී ඇත.

තුන්වන ලෝකයේ රටකින් බිහිවූවකුට ලෝක සාමය පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමිවීම ගැන සංවර්ධනය වෙමින් පවතින රටවල බොහෝ සංවිධාන සිය සතුට පළ කොට තිබේ.

එහෙත් ඒ ප්‍රසාදය පළ කරන අතරම ඇෆ්ගනිස්ථානයට එරෙහිව ඇමරිකාව එල්ල කරන ප්‍රහාර වැළැක්වීමට ඉදිරිපත් නොවීම ගැන අන්නන්ට විරෝධය පළකරන්නෝ ද සිටිති.

එමිරාටි ජාතික පුවත්පතක් වන අල් කලීජ් පුවත්පත ඒ පිළිබඳ කියන්නේ මෙවැනි දෙයකි.

"එක්සත් ජාතීන්ගේ සංවිධානයට සාම ත්‍යාගය හිමිවූවේ 1945 සිට මේ දක්වා යුද්ධ වළක්වා සාමය තහවුරු කිරීම වෙනුවෙන්. එහෙනම් ඇයි එය ඇෆ්ගනිස්ථානයට ඇමරිකාව කරන දේ වළක්වන්න ඉදිරිපත් නොවන්නේ."

## සාහිත්‍යය

මෙවර සාහිත්‍යය පිළිබඳ නොබෙල් ත්‍යාගය හිමිවූවේ වී.එස්. නයිපෝල්ට ය. ඔහු ඉන්දියානු සම්භවයක් ඇති ට්‍රිනිඩෑඩ් ලේඛකයෙකි. 1932 දී ඉන්දියාවේ උපත ලද ඔහු දිගුකලක් තිස්සේ ලේඛකයකු ලෙස කටයුතු කළේ ය. 1971 දී ඔහු ලියූ In a Kree Stare කෘතියට බුකර් සම්මානය ද හිමි විය.

## 2001 නොබෙල් ත්‍යාගලාභීන්

**සාමය -**

එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එහි මහලේකම් කොෆි අන්නන් (ඝානාව) මානව හිමිකම් රැකීම, ලොවපුරා ගැටුම් මැඩීම, එක්සත් ජාතීන්ගේ සංගමයට නව ජීවයක් ලබාදීම, ජාත්‍යන්තර ත්‍රස්තවාදයට හා ඒඩ්ස් රෝගයට එරෙහිව සටන්වැදීම යන කරුණු වෙනුවෙනි.



**ආර්ථික විද්‍යාව**

ජෝර් අකෙරොෆ් (ඇමරිකාව)
මයිකල් ස්පෙන්ස (ඇමරිකාව)
ජෝසෆ් ස්ටිග්ලිට්ස් ((ඇමරිකාව)
අසමමිතික තොරතුරු නම් සංකල්පය ඉදිරිපත් කිරීම වෙනුවෙනි



**භෞතික විද්‍යාව**

එරික් කෝනල් (ඇමරිකාව)
කාර්ල් වෙයිමාන් (ඇමරිකාව)
වුල්ෆ්ගැග් කෙටර්ල් (ජර්මනිය)
පදාර්ථයේ (පරමාණුවේ) නව අවස්ථාවක් සොයාගැනීම වෙනුවෙනි.



**රසායන විද්‍යාව**

බැරි ෂාර්ප්ලස් (ඇමරිකාව)
විලියම් ක්නොව්ලස් (ඇමරිකාව)
රියොජි නියොරි (ජපානය)
රෝග ගණනාවකට සුවය ලබා දෙන ඖෂධ නිපදවීම වෙනුවෙනි.



**සාහිත්‍යය**

වී.එස්. නායිපෝල් (ට්‍රිනිඩෑඩ්)



**වෛද්‍ය විද්‍යාව**

ලේලන්ඩ් හාර්ට්වෙල් (ඇමරිකාව)
ටිම් හන්ට් (බ්‍රිතාන්‍ය)
පාවුල් නර්ස් (බ්‍රිතාන්‍ය)



පිළිකා රෝගය සඳහා ප්‍රතිකාර කළ හැකි මං සොයාගත හැකිවන පරිදි සෛලය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම වෙනුවෙනි.

REUTERS